සංශෝධනයයි

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ජනපද නිලධාරි තනතුරේ III ශ්‍රේණියට නිලධාරින් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2026

අංක 2,495 දරන 2026 ජුනි මස 26 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද "ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ජනපද නිලධාරි තනතුරේ III ශ්‍රේණියට නිලධාරින් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2026" විභාග නිවේදනයේ, 02 වන ඡේදයේ අදාළ වගන්තිය සහ 04 වන ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

02. සුදුසුකම් -

I. ***අධ්‍යාපන සුදුසුකම්*** - ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව, කෘෂි තාක්ෂණවේදය, ජෛව පද්ධති තාක්ෂණවේදය සහ තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් තුනකින් (03) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ. පෙළ) විභාගය එකවර සමත් වීම;

සහ

සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

04. වයස් සීමාව

ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 35ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව 2008.10.02 දිනට හෝ ඊට පෙර හා 1991.10.02 දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

තවද, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍යවන සියලුම සුදුසුකම්, අංක 2,495 දරන 2026 ජුනි මස 26 *ගැසට් නිවේදනයේ* සඳහන් 2026.07.31 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය. එසේම මේ වන විටත් අයදුම්පත් යොමුකරන ලද්දේ නම් නැවත අයදුම්පත් යොමු කිරීම අවශ්‍ය නොවේ.

ඉල්ලුම්පත් භාරගනු ලබන අවසන් දිනය - 2026 නොවැම්බර් මස 02

ඉහත සඳහන් සංශෝධන හැර, එම *ගැසට් පත්‍රයේ* පළ කරන ලද අනෙකුත් සියලුම කරුණු නොවෙනස් ව බලපැවැත්වේ. (අංක 2,495 දරන 2026 ජුනි මස 26 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* නිවේදනය අනුව මේ වනවිටත් අයදුම්කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්කිරීම අවශ්‍ය නොවේ.)

චන්දන රණවීර ආරච්චි,
ඉඩම් කොමසාරිස් ජනරාල්,
ඉඩම් කොමසාරිස් ජනරාල්
දෙපාර්තමේන්තුව.

2026 සැප්තැම්බර් මස 28 වැනි දින,
ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,
1200/6, මිහිකත මැදුර,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 - 408

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED